**සියලුම අයදුම්කරුවන් (ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්) වෙත,**

<u>**පළාත් රාජ්‍ය සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් ජාතික පාසල් වෙත ස්ථාන මාරුවීමට අදාල අයදුම්පත පිරවීම සඳහා වන මාර්ගෝපදේශ - අයදුම්කරුවන් සඳහා**</u>

<u>**අයදුම්පත පිරවීමේදී අනුගමනය කළ යුතු පොදු කොන්දේසි**</u>

- **අයදුම්පත පිරවීමට පෙර පහත සඳහන් උපදෙස් හොඳින් කියවා අවබෝධ කරගත යුතුය.**
- **වර්තමානයේ සේවය කරන පළාතෙහි සේවා කාලය 2026.06.30 දිනට වසර 03 කට වඩා වැඩි නිලධාරීන්ට ස්ථාන මාරු සඳහා අයදුම් කළ හැකි වේ.**
- **අයදුම්පත අදාළ නිලධාරියා විසින්ම සම්පූර්ණ කළ යුතුය.**
- **අයදුම්පත යොමු කළ පසු [Submit] බොත්තම click කර විදුහල්පති විසින් නිර්දේශ කළ පසු නැවත සංශෝධන සිදු කළ නොහැකි බැවින් නිරවද්‍යතාවය තහවුරු කරගත් පසු අයදුම්පත යොමු කිරීමට සැලකිලිමත් විය යුතුය.**

1. අයදුම්පත පිරවීමට පෙර ඔබගේ මාධ්‍ය අනුව අදාල උපදෙස් පත්‍රිකාව තෝරාගෙන හොඳින් කියවා අවබෝධ කරගන්න.

2. ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදිව ඇතුලත් කරන්න. එවිට මාර්ගගත ස්ථාන මාරු අයදුම්පත විවෘත වේ.

3. මාර්ගගත විදුහල්පති ස්ථාන මාරු අයදුම්පත පිරවීමේදී පහත උපදෙස් අනුගමනය කරන්න.

4. ඔබගේ පෞද්ගලික තොරතුරු සහ සේවා තොරතුරු නිවැරදිව ඇතුළත් කරන්න.

5. ඔබගේ සේවා තොරතුරු නිවැරදිව ඇතුළත් කිරීමේදී අදාළ දින / කාලසීමාව එහි ඇති Calendar මඟින් තෝරා ඇතුළත් කිරීමට හෝ අදාළ දින ආකෘතිය (Format) අනුව යතුරුලියනය (Type) කළ හැක.

6. වර්තමානයේ තාවකාලික අනුයුක්තයක් ලබා පාසලක හෝ ආයතනයක සේවය කරන්නේ නම් අදාළ සේවා ස්ථානයේ තොරතුරු නිවැරදිව ඇතුළත් කරන්න.

7. ඔබට සේවා ස්ථානයක් එකතු කිරීමට අවශ්‍ය නම්, අදාළ තොරතුරු ඇතුළත් කර [Add more] මත Click කරන්න.

8. ඔබ ස්ථාන මාරුවීමට හේතුව අදාළ හේතු අතරින් නිවැරදිව තෝරාගන්න.

9. අයදුම්පතෙහි ඔබ ලබාදුන් තොරතුරු වලට වඩා වැඩියමක් ඇතුළත් කිරීමට ඇත්නම් එය ඉතා කෙටියෙන් ඇතුළත් කරන්න. මේ සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් කෙටියෙන් කරුණු සඳහන් කළ යුතුය.

10. ඔබ ලබාදුන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සඳහන් කර අදාළ කොටුව Click කළ පසු අයදුම්පත යොමු කළ (Submit) හැකිය.

11. අනතුරුව [Your Application in SLPS is Successfully Submitted] යන්න දිස් වූ පසු පහළින් පෙන්නුම් කරන [Download Application] යන්න Click කර ඔබගේ අයදුම්පත බාගත කරගත හැක.

12. ඔබට ස්ථාන මාරු ලබාගැනීමට ඉල්ලුම් කළ හැක්කේ මෙහි දක්වා ඇති පුරප්පාඩු පවතින පාසල් සඳහා පමණි.

13. එම අයදුම්පතෙහි මුද්‍රිත පිටපතක් ලබාගෙන එහි දිනය හා අත්සන යොදා පාසලේ ස්ථිර විදුහල්පති වෙත තමා විසින්ම අයදුම්පත් යොමුකළ යුතු අවසාන දිනට පෙර භාරදිය යුතුය. අයදුම්කරු පාසලේ ස්ථිර විදුහල්පති ලෙස සේවය කරයි නම් හෝ රාජකාරී ආවරණ කරයි නම් තමාගේ අයදුම්පත කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත සෘජුව යොමුකළ යුතුය. (අයදුම්කරු පාසලේ ස්ථිර විදුහල්පති ලෙස සේවය කරන්නේ නම් විදුහල්පතිගේ නිර්දේශය සඳහා තමා විසින්ම තමාගේ නිර්දේශය ඉදිරිපත් කළ හැක.)

14. පොදු කරුණු :

- අයදුම්පත පුරවා යොමුකළ (Submit) පසු එය සංශෝධනය (Edit) කළහැකි වනුයේ ඊළඟ බලධාරියා විසින් සිය නිර්දේශය ඉදිරිපත් කරන තෙක් පමණි. ඉන්පසු සංශෝධන සිදුකළ නොහැක.
- අයදුම්පත පිරවීමේදී ඉහත කරුණු වලට අමතරව යම් ගැටලුවක් පවතීනම් ඔබගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය, පාසලේ නම හා ලිපිනය, පුද්ගලික දුරකථන අංකය හා ගැටලුව principalbranchnew@gmail.com ඊමේල් ලිපිනයට යොමු කරන්න. (ඊමේල් එකෙහි Subject සඳහා ඔබගේ නම හා පාසල සඳහන් කරන්න. නැතහොත් 0112-784827 / 0112-786252 දුරකථන අංකවලට කාර්යාල වේලාව තුළදී දැනුම්දීමට හැකියාව ඇත.

**සියලුම ස්ථිර විදුහල්පතිවරුන් වෙත,**

**<u>ස්ථිර විදුහල්පති විසින් ස්ථාන මාරු අයදුම්පත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කිරීම සම්බන්ධ උපදෙස්</u>**

1. මේ සඳහා භාවිතා කළ යුතු Username හා Password සකසා ගැනීම පිළිබඳ මාර්ගෝපදේශය ඔබ පාසල අයත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක වෙත ලබා දී ඇති අතර ඒ අනුව Username හා Password සකස් කර භාවිතා කළ යුතුය.

2. මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ස්ථාන මාරු අයදුම්පත් යොමු කරන ලද සියලුම විදුහල්පතිවරුන්ගේ තොරතුරු www.nspt.moe.gov.lk දිගුව ඔස්සේ | Login as a principal | පිවිසුම මඟින් පිවිස සියලු අයදුම්පත් සඳහා නිර්දේශ ලබාදිය යුතුය.

3. තම පාසලේ සේවය කරනු ලබන 2026.06.30 දිනට වර්තමාන පළාතෙහි වසර 03 ක් හෝ ඊට වැඩි හෝ සේවා කාලයක් සහිත මාර්ගගත ක්‍රමය ඔස්සේ ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කරන ලද විදුහල්පතිවරුන්ගේ තොරතුරු ඔබ විසින් පරීක්ෂාකර බලා නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.

4. සියලුම ස්ථාන මාරු අයදුම්පත්වල පිටපත් පාසලේ ස්ථිර විදුහල්පතිගේ නිර්දේශය ද සහිතව **2026.08.07** දින හෝ එදිනට පෙර තම පාසල් අයත් කලාප අධ්‍යාපන කාර්යාලය වෙත පාසලේ ස්ථිර විදුහල්පති විසින්ම යොමුකළ යුතුය.

**සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත,**

**<u>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් විදුහල්පති ස්ථාන මාරු අයදුම්පත් අධ්‍යාපන උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කිරීම සම්බන්ධ උපදෙස්</u>**

1. ජාතික පාසල්හි සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලියේ දී භාවිතා කළ පරිශීලක නාම ( Username ) හා මුර පද (Password) මෙම ස්ථාන මාරු ක්‍රියාවලියේදී ද භාවිතා කළ යුතුය.

2. ඔබට අදාල පරිශීලක නාම ( Username ) හා මුර පද (Password) අමතක වී ඇත්නම් අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ විදුහල්පති ශාඛාවෙහි සහකාර ලේකම් රසාලි විජේසූරිය මහත්මිය අමතා (0112 – 786252)වව නව පරිශීලක නාම ( Username ) හා මුර පද (Password) ලබා ගැනීමට කටයුතු කරන්න.

3. ස්ථාන මාරු අයදුම්පත් යොමු කරනු ලබන සියලුම විදුහල්පතිවරුන්ගේ තොරතුරු (www.nspt.moe.gov.lk) දිගුව ඔස්සේ | Login as a Zonal Director | පිවිසුම මඟින් පිවිස සියලු අයදුම්පත් සඳහා නිර්දේශ ලබා දිය යුතුය.

4. එක් එක් අයදුම් පත්‍රයේ නිලධාරියාට අදාල විනය, විමර්ශන හා විගණන විමසුම් තත්ව පිළිබඳ තහවුරු කිරීමක් සහිතව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශය, තම අත්සන, දිනය හා නිල මුද්‍රාව සහිතව PDF ගොනුවක් ලෙස පරිලෝකනය කර (scan) **2026.08.14** දින හෝ එදිනට පෙර ස්ථානමාරු මාර්ගගත පද්ධතියට උඩුගත ( upload ) කළ යුතුය.

**සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන් වෙත,**

**<u>පළාත් අධ්‍යාපන ලේකම් විසින් විදුහල්පති ස්ථාන මාරු අයදුම්පත් සඳහා නිර්දේශ ලබා දීම සම්බන්ධ උපදෙස්</u>**

1. පළාත් රාජ්‍ය සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ විදුහල්පති ස්ථාන මාරු ක්‍රියාවලියේ දී භාවිතා කළ යුතු පරිශීලක නාම ( Username ) හා මුර පද (Password) සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන් වෙත අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ විදුහල්පති ශාඛාව විසින් ඉදිරියේදී පෞද්ගලිකව දැනුම් දෙනු ඇත.

2. ස්ථාන මාරු අයදුම්පත් යොමු කරනු ලබන සියලුම විදුහල්පතිවරුන්ගේ තොරතුරු වලට (www.nspt.moe.gov.lk) දිගුව ඔස්සේ [Login as a Provincial Secretary] පිවිසුම මඟින් පිවිස **2026.08.21** දින හෝ එදිනට පෙර සියලු අයදුම්පත් සඳහා නිර්දේශ ලබා දිය යුතුය.

**සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන් වෙත,**

**<u>පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් විදුහල්පති ස්ථාන මාරු අයදුම්පත් සඳහා නිර්දේශ ලබා දීම සම්බන්ධ උපදෙස්</u>**

1. පළාත් රාජ්‍ය සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ විදුහල්පති ස්ථාන මාරු ක්‍රියාවලියේ දී භාවිතා කළ යුතු පරිශීලක නාම ( Username ) හා මුර පද (Password) සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන් වෙත අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ විදුහල්පති ශාඛාව විසින් ඉදිරියේදී පෞද්ගලිකව දැනුම් දෙනු ඇත.

2. ස්ථාන මාරු අයදුම්පත් යොමු කරනු ලබන සියලුම විදුහල්පතිවරුන්ගේ තොරතුරු වලට (www.nspt.moe.gov.lk) දිගුව ඔස්සේ [Login as a PPSC Secretary] පිවිසුම මඟින් පිවිස **2026.08.28** දින හෝ එදිනට පෙර සියලු අයදුම්පත් සඳහා නිර්දේශ ලබා දිය යුතුය.